


*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස......*

භාග්‍යවතුන් වහන්සේ ගේ පරිනිර්වාණය ට ප්‍රථම දුන් මහා දානය වන චුන්දකර්මාර පුත්‍රයා විසින් දුන් දානය ට පූජා කරන ලද සූකරමද්දවය මාංශයකැයි සමහරෙක් කියති. එය මාංශයක් නොව හතු වර්ගයකැයි තවෙකෙක් තර්ක කරති.

මේ පිළිබඳව ඇති දුර්මත ඛණ්ඩනය කරනු වස් මහා අට්ඨකථාව හා ටීකාවන් ගෙන් උපුටා ගත් කරුණු පහත දැක්වේ. සැක ඇත්තෝ සැක දුරුකර ගනිත්වා.

**මේ පිළිබඳව පවතින මිථ්‍යා මත**

01. සූකරමද්දව යනු ඌරන් විසින් පාගන ලද තැන්වල හටගත් උණබොඩ විශේෂයකි

02. සූකරමද්දව යනු ඌරන් විසින් පාගන ලද තැන්වල හටගත් නයි හතු විශේෂයකි

03. සූකරමද්දව යනු රසායනික විශේෂයකි

04. සූකරමද්දව යනු පස්ගෝ රස යොදා සාදන ලද මෘදු සිනිඳු ආහාරයකි

පහත දැක්වෙන උපුටනයන් හි යටින් ඉරි ගසා ඇත්තේ ඒ මිත්‍යා මත පිළිබඳව අට්ඨකථාචාරීන් වහන්සේලා එකල කළ පෙන්වා දීම් ය.

**සත්‍යය**

සූකරමද්දව යනු තරුණ නොවූ මහළු නොවූ නොමේරූ ඌරෙකු ගේ මාංශයයි.

01. උදානපාළි අට්ඨකථාව

PA 23 KN3 Udana Attakatha - PDF 277

**පටියාදාපෙත්වාති** සම්පාදෙත්වා. ‘‘**සූකරමද්දවන්ති** සූකරස්ස මුදුසිනිද්ධං පවත්තමංස’’න්ති මහාඅට්ඨකථායං වුත්තං. කෙචි පන ‘‘සූකරමද්දවන්ති න සූකරමංසං, සූකරෙහි මද්දිතවංසකළීරො’’ති වදන්ති. අඤ්ඤෙ ‘‘සූකරෙහි මද්දිතප්පදෙසෙ ජාතං අහිඡත්තක’’න්ති. අපරෙ පන ‘‘සූකරමද්දවං නාම එකං රසායන’’න්ති භණිංසු. තඤ්හි චුන්දො කම්මාරපුත්තො ‘‘අජ්ජ භගවා පරිනිබ්බායිස්සතී’’ති සුත්වා ‘‘අප්පෙව නාම නං පරිභුඤ්ජිත්වා චිරතරං තිට්ඨෙය්‍යා’’ති සත්ථු චිරජීවිතුකම්‍යතාය අදාසීති වදන්ති.

සූකර මද්දවය යනු උරෙකු ගේ මෘදු සිනිඳු වූ පවත්ත මාංශය යැයි මහා අට්ඨකථාවේ කියන ලදී. සමහරු වනාහි සූකර මද්දවය යනු සූකර මාංශයක් නොව ඌරන් විසින් පාගන තැන උණබොඩ වර්ගයක් යැයි කියති. තවත් අය සූකරයන් විසින් පාගන ලද ප්‍රදේශයෙහි හටගත් ගත් නයි හතු වර්ගයකැයි කියති."

"තවත් සමහරුන් සූකර මද්දවය යනු එක් රසායනයකැයි කිවෝ ය."

එහි චුන්දකර්මාර පුත්‍රයා අද භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පානා සේක් යැයි අසා යම්කිසි දෙයක් පරිභෝජණය කොට භාග්‍යවතුන් වහන්සේ චිරාත් කාලයක් ජීවිතය පැවැත්වීමට පහසුවේවා යැයි යන අදහසිනි."

02. දීඝනිකාය අට්ඨකථාව

**සූකරමද්දවන්ති** නාතිතරුණස්ස නාතිජිණ්ණස්ස එකජෙට්ඨකසූකරස්ස පවත්තමංසං. තං කිර මුදු චෙව සිනිද්ධඤ්ච හොති, තං පටියාදාපෙත්වා සාධුකං පචාපෙත්වාති අත්ථො. එකෙ භණන්ති – ‘‘**සූකරමද්දවන්ති** පන මුදුඔදනස්ස පඤ්චගොරසයූසපාචනවිධානස්ස නාමමෙතං, යථා ගවපානං නාම පාකනාම’’න්ති. කෙචි භණන්ති – ‘‘**සූකරමද්දවං** නාම රසායනවිධි, තං පන රසායනසත්ථෙ ආගච්ඡති, තං චුන්දෙන – ‘භගවතො පරිනිබ්බානං න භවෙය්‍යා’ති රසායනං පටියත්ත’’න්ති. තත්ථ පන ද්විසහස්සදීපපරිවාරෙසු චතූසු මහාදීපෙසු දෙවතා ඔජං පක්ඛිපිංසු.

සූකරමද්දවය යනු අතිතරුණ නොවූ අතිමහළු නොවූ එක්තරා ජ්‍යෙෂ්ඨ ඌරෙකු ගේ අනවජ්ජ මාංශයයි. එය වනාහි මෘදු වූත් සිනිඳුවූත් වෙයි. පිළියෙල කළ මාංශයක් විය යනු අර්ථයයි.

සමහරු සූකරමද්දවය යනු මෘදු ආහාරයක්, පස්ගෝ රස යොදා පිළියෙල කරන මෘදු ආහාරයකට නමක් යැයි කියති.

සමහරු සූකරමද්දවය යනු බෙහෙතකි. එය වනාහි වෛද්‍ය ශාස්ත්‍රයේ පැමිණේ. එය චුන්ද විසින් භාග්‍යවතුන් වහන්සේ ගේ පිරිනිවන් පෑම නොවේවා යන අදහසින් බෙහෙතක් පිළියෙල කරන ලදී යි කියති.

එහි වනාහි දෙදහසක් පරිවාර දූපත් ඇතුළු සතරමහා ද්වීපයන්හි දෙවියන් දිව්‍ය ඕජාව බහාලූහ.

තවදුරටත්......

02. දීඝනිකාය ටීකාව

### කම්මාරපුත්තචුන්දවත්ථුවණ්ණනා

**189**. **සූකරමද්දවන්ති** වනවරාහස්ස මුදුමංසං. යස්මා චුන්දො අරියසාවකො සොතාපන්නො, අඤ්ඤෙ ච භගවතො, භික්ඛුසඞ්ඝස්ස ච ආහාරං පටියාදෙන්තා අනවජ්ජමෙව පටියාදෙන්ති, තස්මා වුත්තං ‘‘**පවත්තමංස**’’න්ති. තං **කිරාති** ‘‘නාතිතරුණස්සා’’තිආදිනා වුත්තවිසෙසං. තථා හි තං ‘‘**මුදු චෙව සිනිද්ධඤ්ච**’’ති වුත්තං. මුදුමංසභාවතො හි අභිසඞ්ඛරණවිසෙසෙන ච ‘‘මද්දව’’න්ති වුත්තං. **ඔජං පක්ඛිපිංසු** ‘‘අයං භගවතො පච්ඡිමකො ආහාරො’’ති පුඤ්ඤවිසෙසාපෙක්ඛාය, තං පන තථාපක්ඛිත්තදිබ්බොජතාය ගරුතරං ජාතං.

"සූකර මද්දවය යනු කැලෑ ඌරෙකුගේ මෘදු මාංශය"

සැක ඇත්තෝ සැක හැර ගනිත්වා.....